(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 75.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2021 මැයි 18 අඟහරුවාදා පූ. භා. 10.00 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු කපිල අතුකෝරල මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාරතී දූෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන: කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයට ලක් වූ 'කොළඹ වරාය නගර ආර්ථික කොමිසම' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

'කොළඹ වරාය නගර ආර්ථික කොමිසම' නමැති පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පහත සඳහන් පරිදි වේ:—

පනත් කෙටුම්පතේ 3(6), 30(3) දෙවැනිඅතුරු විධානය, 55(2) සහ 58(1) හි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 3(5) අතුරු විධානය, 3(7), 6(1)(ආ), 30(3) පළමුවැනි අතුරු විධානය, 71(1) සහ 74 [අර්ථ නිරූපණය 'නියාමන අධිකාරිය'] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවටඅනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 3(4), 6(1)(ද), 68(1)(ඊ) සහ 68(3)(අ) වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 ව්‍යවස්ථා සමඟ කියවිය යුතු76 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් සහ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 52(5) සහ 71(2)(ජ) වගන්ති සමඟ කියවිය යුතු 52(3) වගන්තියේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4 සහ 76 ව්‍යවස්ථා සමඟ කියවිය යුතු 148 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් සහ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 30(1), 33(1), 40(2) සහ 71(2)(ඕ) වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඌ) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 53(3)(ආ) වගන්තිය සමඟ කියවිය යුතු 53(2)(ආ) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 ව්‍යවස්ථා සමඟ කියවිය යුතු 76 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් සහ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 60(ඇ) සහ 60(ඊ) වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි සඳහන් කර ඇති පරිදි එම වගන්ති සංශෝධනය කරන්නේ නම් එම අනනුකූලතාවයන් ඉවත්ව යනු ඇත.

පනත් කෙටුම්පතේ 37 වැනි වගන්තියේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(උ) ව්‍යවස්ථාවන්ට අනනුකූල වන අතර එම විධිවිධාන වලංගු ලෙස සම්මත කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශේෂ බහුතරයකින් සම්මත කිරීම මගින් පමණි.

කෙසේ වෙතත්, එකී බලයලත් තැනැත්තකු කොළඹ වරාය නගරයේ බල අධිකාරියට අයත් ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත වන විට, එකී බල ප්‍රදේශයෙන් පිටත, එහෙත් ශ්‍රී ලංකාවේ භූමි භාගය ඇතුළත නිරත වන ඒ හා සමාන ව්‍යාපාරවලට හානියක් සිදුවන ආකාරයෙන් මෙම පනත් කෙටුම්පත යටතේ ලබාදී ඇති මොනයම් හෝ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් භාවිතා කරනු ලැබීම වළක්වමින් 37 වැනි වගන්තියට අලුතින් උප වගන්තියක් එකතු කළහොත් එකී අනනුකූලතාවය ඉවත්වනු ඇත.

පනතේ ඉතිරි වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.''

II

''ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2021 මැයි 13 දින ම'විසින් 'එකතු කළ අගය මත බදු (සංශෝධන)' හා 'දේශීය ආදායම් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.''

2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම: (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIII කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XV කොටස;

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVIII කොටස; සහ

(iv) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXIII කොටස, නවවැනි කාණ්ඩයේ XXIII හා XXIV කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ —

(i) අග්‍රහාර රක්ෂණ භාර අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ දසවැනි කාණ්ඩයේ II කොටස; සහ

(ii) ජාතික විගණන කාර්යාලය වෙත 2018 අගෝස්තු 01 දින සිට 2019 ජූලි 31 දක්වා ලැබී ඇති මහජන නියෝජනයන් සහ එහි වර්තමාන තත්ත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර එම වාර්තාව, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 06 යෝජනා කරන ලදී. දිනැති අංක 2222/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි පිළිගන්වා එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ දෙමළ අධ්‍යයනාංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 22 දිනැති අංක 2220/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 22 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපයේ මූල්‍ය හා ගිණුම්කරණ, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ, ව්‍යාපෘති කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ, අලෙවි කළමනාකරණ, ව්‍යාපාර ආර්ථික විද්‍යා සහ කළමනාකරණ සහ ව්‍යවසායකත්ව අධ්‍යයන අංශ පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 22 දිනැති අංක 2220/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) වැවිලි අමාත්‍යවරයා විසින් 2013 වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) සංචාරක අමාත්‍යවරයා විසින් 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. කාරක සභා වාර්තා පිළිගැන්වීම: රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන්;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්;

(iii) 2006 අංක 11 දරන මුදල් පනත යටතේ නියෝගය; සහ

(iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

4. මහජන පෙත්සම් පිළිගැන්වීම:

(1) (i) රත්නපුර, දේවාලයගාව, අංක 276/12 දරන ස්ථානයෙහි පදිංචි බී. වී. වී. ජේ. බණ්ඩාරවත්ත මහතාගෙන් ලැබුණු 2021.03.05 දිනැති පෙත්සම;

(ii) පන්නිපිටිය, රුක්මලේ, පාසල් මාවත, අංක 108/20 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එච්. ජයලත් ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2021.02.25 දිනැති පෙත්සම;

(iii) රත්මලාන, ශ්‍රී ඥානේන්ද්‍ර පාර, අංක 85/8 දරන ස්ථානයෙහි පදිංචි කේ. එච්. ධම්මික මහතාගෙන් ලැබුණු 2021.02.20 දිනැති පෙත්සම;

(iv) දෙහිවල, ජයවර්ධන මාවත, අංක 11 දරන ස්ථානයෙහි පදිංචි ආර්. පී. ආර්. කන්දප්පා මහතාගෙන් ලැබුණු 2021.02.16 දිනැති පෙත්සම;

(v) කොළඹ 09, දෙමටගොඩ, මිහිඳුසෙන්පුර, අංක 1/ඒ/එෆ්8/යූ/9 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. ප්‍රසන්න කුමාර මහතාගෙන් ලැබුණු 2021.03.10 දිනැති පෙත්සම; සහ

(vi) බණ්ඩාරගම, කඹුරුගොඩ, ගල්මුල්ලාවත්ත, අංක 101/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. සී. ජයරත්න මහතාගෙන් ලැබුණු 2021.03.08 දිනැති පෙත්සම

ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) පාදුක්ක, මලගල, අංක 180/5 දරන ස්ථානයෙහි පදිංචි යූ. එස්. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2021.02.06 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) වලපනේ, වතුමුල්ල, අංක 98/ඩී දරන ස්ථානයෙහි පදිංචි උපාලි දයානන්ද අපොන්සු මහතාගෙන් ලැබුණු 2020.12.12 දිනැති පෙත්සම; සහ

(ii) රිකිල්ලගස්කඩ, ගැටකුලාව, මධ්‍යම පාන්තික නිවාස, අංක 23/01 දරන ස්ථානයෙහි පදිංචි යල්අරාවේ මුදියන්සේලාගේ ගුණතිලක මහතාගෙන් ලැබුණු 2021.01.26 දිනැති පෙත්සම

ගරු සී. බී. රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පරකඩුව, පුස්සැල්ල, යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ.වී.ඒ.නවරත්න මහතාගෙන් ලැබුණු 2021.02.02 දිනැති පෙත්සම ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) කනත්තේ වැව, පලුගස්වෙල යන ලිපිනයෙහි පදිංචි ඒ. ධර්ම ශ්‍රී රණතුංග මහතාගෙන් ලැබුණු 2020.12.30 දිනැති පෙත්සම; සහ

(ii) මහකෙළිය, මහකෙළිය, අංක 102 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. විජේසිංහ මහතාගෙන් ලැබුණු 2020.12.30 දිනැති පෙත්සම

ගරු දයාසිරි ජයසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) මීගමුව, කට්ටුව, හලාවත පාර, අංක 119 දරන ස්ථානයෙහි පදිංචි එම්. සී. රංජිත් පාරිස් මහතාගෙන් ලැබුණු 2020.12.30 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(7) (i) රත්මලාන, වකින්දාරාම පාර, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි ඒ. පී. එස්. අමරසිංහ මහතාගෙන් ලැබුණු 2021.02.27 දිනැති පෙත්සම;

(ii) පැලවත්ත, තොටමුණපේරුව, අංක 69 දරන ස්ථානයෙහි පදිංචි ජී. ජයතිස්ස මහතාගෙන් ලැබුණු 2021.02.18 දිනැති පෙත්සම; සහ

(iii) කළුතර දකුණ, ගමගොඩ, තේවත්ත, අංක 163/1 දරන ස්ථානයෙහි පදිංචි යූ. කේ. ඩී. සංජය දුමින්ද මහතාගෙන් ලැබුණු 2021.03.01 දිනැති පෙත්සම

ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) ගල්කිස්ස, ගාලු පාර, අංක 411/1 දරන ස්ථානයෙහි පදිංචි එච්. බී. තක්ෂිලා සජීවනී මහත්මියගෙන් ලැබුණු 2021.03.02 දිනැති පෙත්සම;

(ii) වැලිමඩ, දඹවින්න, හපුතලේ පාර (2 කණුව) දරන ස්ථානයෙහි පදිංචි පී. අබේරත්න පතිරණ මහතාගෙන් ලැබුණු 2020.12.02 දිනැති පෙත්සම;

(iii) හම්බන්තොට, වැලිගත්ත, පල්ලේමලල, සාමය මාවත, අංක 49/1, "පියුමි" දරන ස්ථානයෙහි පදිංචි එස්. එච්. තිලක් සමන් මහතාගෙන් ලැබුණු 2021.02.15 දිනැති පෙත්සම; සහ

(iv) හාලිඇල, බදුල්ල පාර, පළමුවැනි පටුමග, මධ්‍යම පාන්තික නිවාස, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි ටී. එම්. ධර්මදාස මහතාගෙන් ලැබුණු 2020.12.17 දිනැති පෙත්සම

ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(9) (i) මාතර, යටියන, මැද උයන්ගොඩ, "විජයගිරි" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ජී. දයාවතී මහත්මියගෙන් ලැබුණු 2021.03.05 දිනැති පෙත්සම; සහ

(ii) පුහුල්වැල්ල, කන්දෙ විහාර පාර, අලුත් ගෙදර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු 2021.03.16 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(10) වැලිමඩ, නුවරඑළිය පාර, අංක 59 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. උදිත ලක්සිරි වීරසිංහ මහතාගෙන් ලැබුණු 2021.01.30 දිනැති පෙත්සම ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් පිළිගන්වන ලදී.

(11) රාගම, තලගොල්ල, අංක 82/22 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ජී. එස්. සිල්වා මහතාගෙන් ලැබුණු 2021.03.08 දිනැති පෙත්සම ගරු නලින් ප්‍රනාන්දු මහතා විසින් පිළිගන්වන ලදී.

(12) කැබිතිගොල්ලෑව, කැලෑපුලියන්කුලම යන ලිපිනයෙහි පදිංචි ජී. ධර්මසිරි මහතාගෙන් ලැබුණු 2021.03.18 දිනැති පෙත්සම ගරු රෝහණ බංඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(13) කපුලියද්ද, අංක 52බී දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. ලොකුමැණිකේ මහත්මියගෙන් ලැබුණු 2020.09.17 දිනැති පෙත්සම ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(14) මාස්පොත, සියඹලන්ගමුව, පහළගම, "සැලෝන් සවින්ද්‍රි" යන ලිපිනයෙහි පදිංචි බී. ආර්. ටී. බී. බස්නායක මහතාගෙන් ලැබුණු 2021.03.03 දිනැති පෙත්සම ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(15) නුගතලාව, දිවුරුම්ගම, නව නිවාස, අංක 208 දරන ස්ථානයෙහි පදිංචි එන්. ඩී. සේනාරත්න මහතාගෙන් ලැබුණු 2021.03.09 දිනැති පෙත්සම ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(16) කුලියාපිටිය, අනුක්කනේ, බෝධිමුල්ල, "නෙත්මිණි උයන", අංක 270/8/ඒ යන ලිපිනයෙහි පදිංචි එච්. එල්. සමන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2021.03.15 දිනැති පෙත්සම ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

5. මුදල් පනත යටතේ රෙගුලාසි: අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2004 අංක 11 දරන මුදල් පනතේ 26 වගන්තිය සමඟ කියවිය යුතු 22 වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය''යි ගරු විජිත හේරත් මහතා, ගරු ඉරාන් වික්‍රමරත්න මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.19 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

''ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.00 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. මුදල් පනත යටතේ නියෝගය: අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 05 දිනැති අංක 2209/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. මුදල් පනත යටතේ නියෝගය: අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 6(2) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක 2214/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8. ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය: අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 05 දිනැති අංක 2209/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක

2202/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 21 දිනැති අංක 2202/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 14 දිනැති අංක 2206/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 16 දිනැති අංක 2206/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 13 දිනැති අංක 2210/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු

සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 18 දිනැති අංක 2211/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 11 දිනැති අංක 2214/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(4) වගන්තිය යටතේ සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 05 දිනැති අංක 2217/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2): අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(4) වගන්තිය යටතේ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 23 දිනැති අංක 2220/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19. විදේශ විනිමය පනත යටතේ නියෝග: අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 අංක 12 දරන විදේශ

විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අප්‍රේල් 07 දිනැති අංක 2222/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20. කල් තැබීම (සමූපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම): මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය'' යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 මැයි 19 බදාදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.